**සැ. යු.**- (i) 2023.02.24 වැනි දින පළ කරන ලද අංක 2321 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,322- 2023 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2023.03.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 430 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 431 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 436 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 438 |


*සැ. යු.* -(i) බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත 2023 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව පනත් කෙටුම්පත 2023 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 මාර්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 මාර්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත III වන පංතියේ හිස් මගී ප්‍රවේශ පත්‍ර 50,000,000ක් ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය SRS F. 7893

කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත III වන පන්තියේ හිස් මගී ප්‍රවේශපත් 50,000,000ක් සැපයීම සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසු කරුවන් තම ලංසු ඍජුව හෝ නෛතික ඇටෝර්නි බලපත්‍රයක් මගින් බලගැන්වූ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි බලය පැවරූ නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

02. ලංසුකරණ ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. යෝග්‍යතාපූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට 2023.02.10 දින සිට 2023.03.27 දින තෙක් පැය 9.00 සිට පැය 15.00 දක්වා කාර්යාල දිනයන්හි දී පහත ලිපිනයෙන් වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත් ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, (ප්‍රසම්පාදන),
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. මෙම ලංසුකරණ ලියවිල්ලෙහි දක්වෙන පිරිවිතරයන්හි සඳහන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පසුගිය වසර පහ තුළ ඉහත අයිතම හෝ සමාන අයිතම සංවිධාන වලට සැපයීම පිළිබඳ පෙර වාර්තා සැපයූ භාණ්ඩ පිළිබඳ කාර්යසාධන සහතික සමග ඉහත අයිතම සැපයීම සඳහා හැකියාව හා සාමාර්ථ්‍යය තමන් සතු බවට ලේඛනමය සාක්ෂි ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය. භාණ්ඩ සපයන ලද ආයතනවල පසුගිය සැපයුම් වාර්තා පැහැදිලි කළ යුතු අතර, අදාළ සියලුම ලිපි ලේඛනවල ඡායා පිටපත් පැහැදිලිව හා පහසුවෙන් කියවිය හැකි විය යුතු ය.

05. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 31,000.00 ක හෝ පහසුවෙන් මාරුකරගත හැකි මුදල් වර්ගයකින් සමාන මුදලක් ගෙවීමෙන් අනතුරුව 2023.02.10 දින සිට 2023.03.27 දින පැය 15.00 තෙක් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ඉහත ලිපිනයෙන් හෝ 2023.03.27 දින ශ්‍රී ලංකා වේලාවෙන් 15.00 පැය තෙක් ශ්‍රී ලංකා විදේශ දූත කාර්යාල වෙතින් ලබාගත හැකි ය.

06. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් නිකුත් කළ රු. 1,850,000.00 ක කොන්දේසි විරහිත ආකාරයේ ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු ය.

07. ලංසු **2023.03.28 දින 14.00** පැයට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතු අතර ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද ලංසු භාර නොගැනේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කොට් මාවත, කොළඹ 10.
ශ්‍රී ලංකාව.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංක : SRS/ F. 7893

03-17

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - රුවන්වැල්ල

### අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රුවන්වැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් භාණ්ඩ **2023.03.30 දින ප. ව. 1.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. වෙන්දේසිය කිරීමට නියමිත කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින ප. ව. 12.00 සිට ප. ව. 1.00 දක්වා කාලය තුළ ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

3. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

4. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

5. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

6. වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

7. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ශශිකා මිතුන ආරච්චිගේ,
දිසා විනිසුරු/ මහෙස්ත්‍රාත්.

2023 පෙබරවාරි මස 13 වැනි දින,
රුවන්වැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**රාජසන්තක කරන ලද, නඩු කටයුතු අවසන් වූ භාණ්ඩ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

වෙන්දේසි දිනය : 2023.03.30

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | 99853 | වතුර මෝටර් 01 |
| 02. | 99853 | කොළ පාට හෝස් බට 01 |
| 03. | 99853 | යකඩ බාල්දි 01 |
| 04. | 99853 | බට ලී කුඩ 03 |
| 05. | 95792 | අගල් 22 දිගැති තලය සහිත කපන මැෂින් 01 |
| 06. | 99382 | රතු පැහැති ඉටි පැදුරු 01 |
| 07. | 99940 | යකඩ බාල්දි 01 |
| | | බට පතුරු කුඩ 01 |
| 08. | 99886 | ගැස් ලිප් 01 |
| | | ගැස් සිලින්ඩර් 01 |
| 09. | 00236 | උදලු 01 |
| | | ඉල්ලන් කුරු 01 |
| | | වේවැල් කුඩ 02 |
| | | යකඩ සවල් 01 |
| 10. | අංක රහිත | මෝටර් කොටස නැති කොම්ප්‍රෙෂර් යන්ත්‍රයේ ටැංකිය හා බටය |
| 11. | අංක රහිත | Robin වර්ගයේ කොම්ප්‍රෙෂර් යන්ත්‍රය |
| 12. | අංක රහිත | පැරණි VHS යන්ත්‍රය (ඩෙක්) |
| 13. | අංක රහිත | පැරණි VHS Royal යන්ත්‍රය (ඩෙක්) |
| 14. | අංක රහිත | පැරණි SONICA කැසට් යන්ත්‍රය |
| 15. | අංක රහිත | පැරණි Panasonic වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 16. | අංක රහිත | පැරණි Sony වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 17. | අංක රහිත | පැරණි Singer වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 18. | අංක රහිත | පැරණි JEC වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 19. | අංක රහිත | පැරණි Camy වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 20. | අංක රහිත | පැරණි VSD වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 21. | අංක රහිත | පැරණි SHARP වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 22. | අංක රහිත | පැරණි Singer වර්ගයේ කැසට් යන්ත්‍රය |

03-10

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව ඉදිරිපත් කරනු ලැබූ හා රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියෝග කරන ලද සහ කාර්යාලයෙන් ඉවත් කරන ලද පහත සඳහන් භාණ්ඩයන්/ද්‍රව්‍යයන් **2023.03.18 වැනි දින පෙරවරු 9.30 ට** නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයන් /ද්‍රව්‍යයන් පිළිබඳව හිමිකම් කියාපාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩයන්/ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන්/ ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩයන්/ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත්/මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06.වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන අය තම තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

කේ. ඒ. ආර්. නදීශානී,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2023 පෙබරවාරි මස 15 වැනි දින,
නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2023.03.18 දින නිකවැරටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් | ප්‍රමාණය |
|---|---|---|---|---|
| (1) | AR 1106/21 | NWTW 3009 හීරෝ හොණ්ඩා යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| (2) | AR 700/20 | NWUM 2043 යතුරුපැදිය | වාහනයක් ලෙස | 01 |
| (3) | 54110 | BBS 1118 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| (4) | 39389 | NWBFY 6486 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| (5) | 51470 | NWPQ 3743 ඩිමෝ බට්ටා වර්ගයේ ලොරි රථය | වාහනයක් ලෙස | 01 |
| (6) | 51159 | NWRB 0243 ට්‍රැක්ටර් රථය | වාහනයක් ලෙස | 01 |
| (7) | 51159 | NWRW 3719 ට්‍රැක්ටර් ට්‍රේලරය | වාහනයක් ලෙස | 01 |
| (8) | 31623 | NCGS 9673 ට්‍රැක්ටර් රථය | වාහනයක් ලෙස | 01 |
| (9) | 31623 | 67-2688 ට්‍රැක්ටර් ට්‍රේලරය පාවිච්චි කරන ලද | අමතර කොටස් ලෙස | 01 |
| (10) | 35702 | BDV 4151 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| (11) | AR 155/21 | NW BHV 8255 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් | ප්‍රමාණය |
|---|---|---|---|---|
| (12) | AR 815/20 | ROZENDO RN 110 | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (13) | AR 730/20 | මෝපේඩ් වර්ගයේ යතුරුපැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (14) | 45443 | 113-5063 යතුරු පැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (15) | AR 156/21 | 158-0175 යතුරු පැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (16) | 50099 | 110-6111 යතුරු පැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (17) | AR 701/20 | BHM 8535 යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| (18) | 51210 | NWTS 4937 යතුරු පැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (19) | 12661 | LB 8389 ලොරි රථය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (20) | 59277 | SEA NO 23669 දරන අත්ට්‍රැක්ටරය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (21) | 51865 | 13080015 අංක දරන අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| (22) | 12190 | 68-5281 ලොරි රථය | අමතර කොටස් ලෙස | 01 |
| (23) | AR 262/21 | 134-2482 යතුරු පැදිය | අමතර කොටස් ලෙස | 01 |
| (24) | 34434 | පොරොව | | 01 |
| (25) | 31228 | යකඩ බාල්දි | | 01 |
| (26) | 26142 | ප්ලාස්ටික් පුනීල | | 01 |
| (27) | 49493 | නියන් 01, අතකොළු | | 01 |
| (28) | 48195 | නියන් 01, අතකොළු | | 01 |
| (29) | 40713 | ගස් කපන යන්ත්‍ර | | 01 |
| (30) | 47011 | ගස් කපන යන්ත්‍ර | | 01 |
| (31) | 63178 | ගෑස් සිලින්ඩර් | | 01 |
| | | ඇලුමිනියම් කළ | | 01 |
| | | ප්ලාස්ටික් බේසම් | | 01 |
| | | ගෑස් ලිප් | | 01 |
| (32) | 53332 | ගෑස් සිලින්ඩර් | | 01 |
| (33) | 51493 | වල් කපන කැති | | 01 |
| (34) | 26730 | ගස් කපන යන්ත්‍ර | | 02 |
| (35) | 31160 | සවල් | | 01 |
| (36) | 61981 | ප්ලාස්ටික් වතුර ටැංකි | | 01 |
| (37) | - | ප්ලාස්ටික් බැරල් තොගයක් | | - |
| (38) | - | ප්ලාස්ටික් බූලි තොගයක් | | |
| (39) | - | වීදුරු බෝතල් තොගයක් | | |
| (40) | | වානේ කබඩ් ලාච්චු 04 | | 01 |
| (41) | | 7191704 දරන යතුරු ලියන යන්ත්‍ර | | 01 |
| (42) | | බිත්ති විදුලි පංකා | | 01 |
| (43) | | කැරකෙන පරිගණක පුටු | | 03 |
| (44) | | පරිගණක ප්‍රින්ටර් | | 03 |
| (45) | | පරිගණක බැටරි | | 03 |
| (46) | | පරිගණක යන්ත්‍ර හා උපාංග CPU | | 02 |
| | | KEY BOARD | | 01 |

## මහෙස්ත්‍රාත් අධිකරණය - කළුවංචිකුඩි

### ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවල දී අත්පත් කර රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ **2023.03.11** වැනි දින **පෙ. ව. 9.30** ට කළුවංචිකුඩි මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත ය.

කළුවංචිකුඩි මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.30 සිට පෙ. ව. 9.30 ට දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසිය සිදුකරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

ජේ. බී. ඒ. රන්ජිත් කුමාර,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කළුවංචිකුඩි.

2023.02.20

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය

| අංක | නඩු අංක | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|---|
| 1. | 27014/ood/21 | EP/BEV/3100 | යතුරු පැදිය | 01 |
| 2. | 25742/E/20 | EP/BEV/9129 | යතුරු පැදිය | 01 |
| 3. | 24680/F/20 | EP/XO/7509 | යතුරු පැදිය | - |
| 4. | AR/56/22 | EP/MR/7926 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 5. | 19326/E/17 | EP/BDW/7946 | යතුරු පැදිය | 01 |
| 6. | 12982/Pc/14 | EP/WN/7517 | යතුරු පැදිය | 01 |
| 7. | 4369/F/12 | RY/4284 | ටේලරය (අමතර කොටස් පමණි) | 01 |
| 8. | B/166/20 | 69531869 | පාපැදි | 01 |
| 9. | B/166/20 | 88737 | පාපැදි | 01 |
| 10. | B/166/20 | 69355825 | පාපැදි | 01 |
| 11. | B/166/20 | 60582623 | පාපැදි | 01 |
| 12. | B/166/20 | 69895017 | පාපැදි | 01 |
| 13. | B/166/20 | 69347708 | පාපැදි | 01 |
| 14. | B/166/20 | - | | |
| 15. | B/166/20 | L 23900 | පාපැදි | 01 |
| 16. | B/166/20 | 69511377 | පාපැදි | 01 |
| 17. | B/166/20 | 69272872 | පාපැදි | 01 |
| 18. | B/200/20 | 60145 | පාපැදි | 01 |
| 19. | B/200/20 | - | | |
| 20. | B/200/20 | 69835072 | පාපැදි | 01 |
| 21. | B/200/20 | 91905175 | පාපැදි | 01 |
| 22. | B/200/20 | N 196562 | පාපැදි | 01 |
| 23. | B/200/20 | UN 757071 | පාපැදි | 01 |
| 24. | B/200/20 | 6928604 | පාපැදි | 01 |
| 25. | B/200/26 | 97958569 | පාපැදි | 01 |
| 26. | B/354/20 | LA 6000964 | පාපැදි | 01 |
| 27. | B/354/20 | 1918869 | පාපැදි | 01 |
| 28. | B/354/20 | C 214548 | පාපැදි | 01 |
| 29. | B/354/20 | AA 02657 | පාපැදි | 01 |
| 30. | B/354/20 | ALU90874 | පාපැදි | 01 |
| 31. | B/354/20 | SP 758573 | පාපැදි | 01 |
| 32. | B/354/20 | 6934681 | පාපැදි | 01 |
| 33. | B/354/20 | 478609 | පාපැදි | 01 |
| 34. | B/215/20 | 69832118 | පාපැදි | 01 |
| 35. | B/215/20 | 565181786 | පාපැදි | 01 |
| 36. | B/215/20 | - | පාපැදි | 01 |
| 37. | B/215/20 | - | පාපැදි | 01 |
| 38. | B/215/20 | - | පාපැදි | 01 |
| 39. | B/370/2 | 694669 | පාපැදි | 01 |
| 40. | B/370/20 | Alu004639 | පාපැදි | 01 |
| 41. | B/214/20 | 69276407 | පාපැදි | 01 |
| 42. | B/214/20 | 56517739 | පාපැදි | 01 |

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මිනුවන්ගොඩ

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද, රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ **2023.03.25 වැනි දින පෙ. ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නන් වේ නම් වෙන්දේසි පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු යි.

රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබාගෙන 2023.03.25 දින පෙ. ව. 8.30 සිට පෙ. ව. 9.30 දක්වා වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කළ හැක.

වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් ම ගෙවිය යුතුය. මේ සඳහා චෙක්පත් භාර ගනු නොලබන අතර, මිල දී ගත් භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

වෙන්දේසි භාණ්ඩ ඉල්ලුම්කරුවන් හා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමට නොහැකි වන්නන්ට වෙන්දේසි භූමියට ඇතුල්වීමට අවසර දෙනු නොලැබේ.

අධිකරණය විසින් තබනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

තව ද, නිසි සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේදයන් පිළිපැදිය යුතු යි. එමෙන් ම සමාජ දුරස්ථභාවය උපරිම ලෙස තබා ගැනීමට කටයුතු කළ යුතු යි.

තීසානි තේනබදු,
මහෙස්ත්‍රාත්.

2023 පෙබරවාරි මස 20 වැනි දින,
මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට අදාළ නඩු භාණ්ඩ - 2023.03.25

| | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | AR28375 / 771/21 | රන්දම් වැලක් අඩංගු යැයි කියන මුද්‍රා තැබූ වීදුරු බෝතලය | 01 |
| 2. | ODD 14115 / PR 258/21 | WP QP 2978 ත්‍රී රෝද රථය | 01 |
| 3. | 85199 (B1241/18) | 136 - 0618 යතුරු පැදිය | 01 |
| 4. | 54336 (B937/15) | 121 - 4685 යතුරු පැදිය | 01 |
| 5. | AR 11705 / PR 658/19 | WP JT 2217 යතුරු පැදිය | 01 |
| 6. | AR 22148 / PR 113/21 | HM 3060 යතුරු පැදිය | 01 |
| 7. | AR 22150 / 457/21 | MN 5901 යතුරු පැදිය | 01 |
| 8. | AR 25579 | MT 7135 යතුරු පැදිය | 01 |
| 9. | AR 22291 | 14 ශ්‍රී 0857 යතුරු පැදිය | 01 |
| 10. | AR 25595 | 90 ශ්‍රී 1119 යතුරු පැදිය | 01 |
| 11. | AR 25600 | MU 1194 යතුරු පැදිය | 01 |
| 12. | AR 25602 | HD 7079 යතුරු පැදිය | 01 |
| 13. | AR 25605 | 142 - 8154 යතුරු පැදිය | 01 |
| 14. | AR 27230 / PR 117/22 | බෝට්ටු | 01 |
| 15. | AR 27231 / PR 09/22 | බෝට්ටු | 01 |
| 16. | AR 27232 / PR 191/21 | පාරුව | 01 |
| 17. | 28164 | 12.05 k ගෑස් සිලින්ඩර් | 02 |
| | | ගෑස්ලිප් | 01 |
| 18. | 25026 | 12.05 k ගෑස් සිලින්ඩර් | 06 |
| | | ගෑස් ලිප් | 04 |
| | | රෙගියුලේටර් | 04 |
| | | කැසට් රේඩියෝ යන්ත්‍ර | 01 |
| 18 | 34244 | 12.05 k ගෑස් සිලින්ඩර් | 01 |
| | | වට හතරකින් යුත් ගෑස් ලිප් | 01 |
| 19. | 28462 | වට පහකින් යුත් ගෑස් ලිප් | 03 |
| | | (බැරල්) | 30 |
| 20. | 30680 / PR 539/22 | උදලු | 02 |
| | | වේවැල් කුඩ | 02 |
| 21. | 32206 / PR 807/22 | සවල | 01 |
| 22. | 32207 / PR 806/22 | සවල | 01 |

| | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 23. | B 1704/22 | අඩි 3 අගල් 3ක් දිග සවල | 01 |
| | 35552 | අඩියක් දිග උදලු | 01 |
| | PR 1092/22 | අඩි 8ක් උස ඇලුමිනියම් ඉනිමග | 01 |
| | PR 1091/22 | යවුල් | 01 |
| | | අඩි 5ක් දිග යකඩ නාරාසන | 01 |
| | PR 1090/22 | දුම් කබල, යකඩ ගිරය | |
| 24. | 29843 | යකඩ බැරල් | 25 |
| 25. | 29844 | යකඩ බැරල් | 15 |
| 26. | 29845 | යකඩ බැරල් | 25 |
| 27. | 30244 | යකඩ බැරල් | 10 |
| 28. | | ලොකු බූලි කෑන් තොගයක් | |
| | | කුඩා කෑන් තොගයක් | |
| | | වීදුරු බෝතල් තොගයක් | |

03-90

# රජයේ නොවන දැන්වීම්

## එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී

සමාගමේ ලියාපදිංචි අංකය PB 173

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඇවරකරුගේ පත්වීමේ දැන්වීම

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03<br>සහ<br>අංක 431/A 2, ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවත, පිටකෝට්ටේ |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, කොළඹ (සිවිල්) |
| නඩු අංකය | : | 83/2021/CO |
| ඇවරකරුගේ නම | : | ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් |
| ලිපිනය | : | වරලත් ගණකාධිකාරී SJMS ඇසෝසියේට්ස් 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04 |
| පත්වීම බලාත්මක වූ දිනය | : | 2023 පෙබරවාරි 01 |

03-28/1

---

## එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී

සමාගමේ ලියාපදිංචි අංකය PB 173

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ පරිවෘත කිරීමේ නියෝගය

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03<br>සහ<br>අංක 431/A 2, ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවත, පිටකෝට්ටේ |

| | | |
|---|---|---|
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, කොළඹ (සිවිල්) |
| නඩු අංකය | : | 83/2021/CO |
| නියෝගය දුන් දිනය | : | 2022 ජුනි 17 |
| පෙත්සම ඉදිරිපත් කල දිනය | : | 2021 නොවැම්බර් 01 |
| ඈවරකරුගේ නම | : | ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් |
| ලිපිනය | : | වරලත් ගණකාධිකාරි SJMS ඇසෝසියේට්ස්, 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04 |

03-28/2

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 242(3) (ආ) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීමේ නිවේදනය**

තුර්යා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම හා තුර්යා රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ඒකාබද්ධ කිරීම

තුර්යා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (සමාගම් අංක PV 6690) හා තුර්යා රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (සමාගම් අංක PV 71418) යන සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (2) වගන්තිය ප්‍රකාරව තුර්යා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම හා තුර්යා රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම එක් අස්ථිත්වයක් බවට ඒකාබද්ධ කරනු ඇති බවත් මින් ඉදිරියට තුර්යා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ලෙස පවත්වාගෙන යන බවටත් යෝජනා සම්මත කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම 2023 අප්‍රේල් මස 01 වැනි දින සිට බලාත්මක වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එයිට්කන් ස්පෙන්ස් කෝපරේට් ෆයිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
තුර්යා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ලේකම්වරුන්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එයිට්කන් ස්පෙන්ස් කෝපරේට් ෆයිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
තුර්යා රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ලේකම්වරුන්.

03-41

---

**පොදු නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡෙදය ප්‍රකාර සමාගම් ඒකාබද්ධ කිරීම

සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී (සමාගම් අංක PQ 160) සහ සිංගර් ඩිජිටල් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පීවී 98605)

සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී (සමාගම් අංක PQ 160) සමග සිංගර් ඩිජිටල් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක PV 98605) යන සමාගම් ද්විත්වය, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරන ලද බව සමාගම් පනතේ 244(3) ඡේදය යටතේ දැනුම් දෙනු ලැබේ. ඒකාබද්ධ සමාගමේ නව නාමය සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී වන අතර, එකී ඒකාබද්ධ කිරීම සමාගම් පනතේ නියමයන්ට අනුකූලව සම්පූර්ණ කර ඇත.

ඒකාබද්ධ කිරීමේ දිනය : 2023 ජනවාරි 30

අධ්‍යක්ෂ මණ්ඩලයන් හි නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2023 පෙබරවාරි මස 17 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10.

03-95

**ගාඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් PB 4736* සහ සී ටී සී එල් එස් ඒ ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් PE 19841* සමාගම් එකතුව ඒකාබද්ධ කිරීම**

මෙමගින් දැනුම්දෙනු ලබන්නේ 2007 අංක 7 සමාගම් පනතේ "(පනත)" වගන්ති 242 (3) (අ) ප්‍රකාරව ගාඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් හා සී ටී සී එල් එස් ඒ ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් වල එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල මගින් ස්ථිර කරගත්තා වූ අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා මගින් එකී සමාගම් පනතේ 242 (2) වගන්ති ප්‍රකාරව ඒකාබද්ධ කිරීමය.

ඒකාබද්ධ කළ සමාගම් නාමය සී ටී සී එල් එස් ඒ ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අතර ඒකාබද්ධ කිරීම 2023 මාර්තු 31 වැනිදා හෝ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කෙරෙන දිනයක සිදුවේ.

ඒකාබද්ධ කිරීම අනුමත කිරීමේ යෝජනාවන් පනතේ 242 (4) වගන්ති ප්‍රකාරව ඒකාබද්ධ කිරීමේ යෝජනා අඩංගු වන සේ සලකන අතර එම යෝජනාවන් ඕනෑම ඒකාබද්ධ කෙරෙන සමාගමක කොටස්කරුවෙකු හෝ ණයහිමියෙකු හෝ ඒකාබද්ධ කෙරෙන සමාගමකට බැඳීමක් ඇති පුද්ගලයෙකුගේ පරීක්ෂාව සඳහා සාමාන්‍ය රාජකාරි කාල සීමාව තුළ කොළඹ 4, ස්ටේෂන් පාර, අංක 4 -15 මැජෙස්ටික් සිටි අංක 10 හි තබා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්,
ගාඩියන් ඇක්විටි ඇසෙට් මැනෙජ්මන්ට් ලිමිටඩ්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්,
සී ටී සී එල් එස් ඒ ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

03-116

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී. එල්. සී. (වරකාපොල ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

**මාහේන ගමෙ හි කුඩානයිදෙගෙහේන වර්තමානයේ කුඩානයිදෙගේ වත්ත හි පිහිටි වටිනා දේපළක් වෙන්දේසියේ විකිණීම**

සබරගමුව පළාතේ, කැගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරලේ කීරවැලි පත්තුවේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ මාහේන ග්‍රාම නිලධාරි වසමේ මාහේන ගමෙ හි පිහිටි කුඩානයිදෙගේහේන වර්තමානයේ කුඩානයිදෙගේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් මැන සාදන ලද අංක 2006/308 සහ 2006.12.28 දිනැති පිඹුරේ බෙදා වෙන් කළ ලොට් අංක 01 දරන ඉඩම් කැබැල්ලට මායිම්:- උතුරට :ඇල සහ පාරද, නැගෙනහිරට : පාර සහ ලොට් අංක 1 දරන කැබැල්ලෙ හි ඉතිරි කොටස ද, දකුණට : ලොට් අංක 01 දරන කැබැල්ලෙ හි ඉතිරි කොටස සහ බස්නාහිරට: පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ ඇල ද, මායිම් වූ ඉහත කී පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් දහය (රූ. 1, පර්. 10) ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේ සමග වන අතර මෙම ඉඩම කැගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 1097/259 හි ලියාපදිංචි කර ඇත.

තවද, (ඉහත සඳහන් උපලේඛනයෙ හි සවිස්තරව දක්වෙන) සබරගමුව පළාතේ, වරකාපොල, මාහේන මහනුවර පාරේ, අංක 465 ස්ථානයේ කැගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ පිහිටි ලිට්ල් හවුස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි තබා ඇති ගබඩාකර ඇති හෝ අනුබද්ධ හෝ ඇඳා ඇති එක් එක් හෝ සියලුම පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සවිකිරීම් හා උපාංග ද සමග වේ.

| විස්තරය | වර්ගය | අනුක්‍රමික අංකය | ප්‍රමාණය |
|---|---|---|---|
| 2000 L included drat cross flow type cooling plant | AE 215 C | 2568742105 | 1 |
| Drift Eliminator and sliding louvers | අදාළ නොවේ | අදාළ නොවේ | 1 |
| 7.5 HP 3 HP Motor | AEEF 112M- 2 | 0125653478 | 2 |
| SS Fan and Copper casing panel cooling tower | අදාළ නොවේ | අදාළ නොවේ | 1 |
| 500L/ph. S/S Homogenizer | FBF 007 | 09042408 | 1 |
| Electric automatic sensor monitor with phase balancing featured digital control panel board | අදාළ නොවේ | අදාළ නොවේ | 1 |
| 200L S/S 302 Milk tanks | අදාළ නොවේ | අදාළ නොවේ | 2 |
| 2HP S/S 302 Food grade milk pumps | අදාළ නොවේ | අදාළ නොවේ | 4 |
| S/S 302 pipe line with utilities | අදාළ නොවේ | අදාළ නොවේ | 1 |
| Total unit frame | අදාළ නොවේ | අදාළ නොවේ | 1 |
| Heat & chilled S/S plate exchange | අදාළ නොවේ | අදාළ නොවේ | 1 |

තවද, මෙහි ඉහත සවිස්තරව දක්වෙන ඉඩම් කැබැල්ලේ විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධති උපකරණ සහ වායු සමීකරණ උපකරණ ඇතුළු වර්තමානයේ තිබෙන හෝ මෙහි මින්මතු කලින් කලට සවිකරන ලබන හෝ ස්ථිර ව ඇඳුනු සියලු සහ වෙන් වෙන් වශයෙන් වූ නිශ්චල පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, උපකරණ සවිකිරීම්, උපාංග හා සේවාවන් සහ සියලුම උපකරණ ද සමග වේ.

ලිට්ල් හවුස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, මඩවල මද්දුමගේ දොන් සංජීව කනිෂ්ක ආරියවංශ සහ මානගොඩගමගේ අමාලි නිරෝෂනී වික්‍රමනායක යන අය උකස්කරුවන් වශයෙන් කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. තරංගා අයෝමි රත්නායක මහත්මිය විසින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. (බැංකුව) වෙනුවෙන් ලියා සහතික කරන ලද 2016.12.14 දින දරන උකස් බැඳුම්කර අංක 9614 සහ උකස් බැඳුම්කර අංක 9616 යටතේ වන ගෙවීම් පැහැර හැර ඇත.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. (බැංකුව) විසින් මා වෙත පවරා ඇති අවසරය පිට මා විසින් **2023 මාර්තු මස 17 වැනි සිකුරාද පෙ. ව. 11.00** ට එම ස්ථානයේ දී ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට යන මාර්ගය .-* එන්. ඩී. බී. බැංකුවේ වරකාපොල ශාඛා පරිශ්‍රයේ සිට කොළඹ මහනුවර පාරේ, මහනුවර දෙසට කි. මී. 2.1ක් පමණ අඹේපුස්ස හන්දිය දක්වා ගොස් එතැනින් දකුණට හැරී නුවර පාරේ මීටර් 300ක් පසු කල විට එම පාරේ වම් පැත්තෙහි ඇති මෙම ඉඩමට ළගා විය හැකි ය.

*ගෙවීම් කළ යුතු ආකාරය. -* ජයග්‍රාහි ගැනුම්කරු විසින් ලංසුව පහත හෙලන විට පහත සඳහන් ගණන් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු වෙළඳ බදු වලින් 1%ක් (සියයට එක)
3. වෙන්දේසි කරුගේ කොමිස් මුදල වන ගැණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙක හමාර) සහ කොමිස් මුදලට අදාල බදු මුදල්,
4. ලිපිකරුගේ සහ ඝෝෂකගේ ගාස්තු වන රු. 1,000,
5. විකිණීමේ වියදම් සහ වෙනත් අයකිරීම් ඇතොත් ඒවා,
6. නොතාරිස්වරයාගේ සේවා කොන්දේසි ගාස්තුව වන රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් බලධාරියෙකු විසින් පනවනු ලබන හෝ අදල වන වෙනත් ව්‍යවස්ථාපිත බදු අයකිරීම්, තීරු බදු ගාස්තු ආදිය ද සමග විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත ගෙවිය යුතු ය.

හිමිකම් සහතික සහ අදාළ වෙනත් ලේඛන පහත සඳහන් ලිපිනය දරන ස්ථානයේ දී පරීක්ෂා කළ හැකිය.

කළමණාකරු - මධ්‍යගත අයකිරීම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.
අංක 50, නවම් මාවත, කොළඹ 02.
දුරකථන අංක 011- 2448448.

ඉහත සඳහන් වෙන්දේසිය පූර්ව දැනුම් දීමකින් තොරව නැවැත්වීමට, අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත. කෝවිඩ් 19 නීති රීති සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලැබූ මාර්ගෝපදේශ වලට අනුව වෙන්දේසිය පවත්වනු ලැබේ.

Dallas Kelaart,
License Auctioneer

No. 146/3, Caldera Gardens *Off* Dutugamunu Street, Kohuwela
Tel: 11 4302622, 11 4302623 aucslk@gmail.com

03-102

---

**නැෂනල් ඩෙවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.**
**(වරකාපොල ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

**නන්ගල්ල ගම ''දෙල්ගහගොඩැල්ල'' හි පිහිටි වටිනා දේපළක් වෙන්දේසියේ විකිණීම**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරලේ ඔතාරා පත්තුවේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ නාගල්ල ග්‍රාම නිලධාරි වසමේ නන්ගල්ල ගමෙහි පිහිටි දෙල්ගහගොඩැල්ල නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. ආර්. එම්. බී. ජයකොඩි විසින් මැන සාදන ලද අංක 2013/84 සහ 2013.06.02 දිනැති පිඹුර ප්‍රකාරව ලොට් අංක 01 දරන ඉඩමට මායිම් උතුරට : ප්‍රධාන පාර ද, (තුල්හිරියේ සිට අලව්ව) නැගෙනහිරට : ප්‍රධාන පාර, (තුල්හිරියේ සිට අලව්ව) දකුණට : ඒ. ඩබ්ලිව්. තිලකරත්නගේ මු. පි. කැ. 2073 හි කැබලි අංක 103 ලෙස සඳහන් වූ ඉඩම ද, බටහිරට : ඩබ්ලිව්. මෛත්‍රිපාලගේ මු. පි. කැ. 2073 හි කැබලි අංක 103 ලෙස සඳහන් වූ ඉඩම ද, ඉහත කී 2013/84 දරන පිඹුරේ පර්චස් තිස් දෙක (පර්. 32) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේ සමග වේ. මෙම ඉඩම් කෑගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක K 12/110 හි ලියාපදිංචි කර ඇත.

තවද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ලේ විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධති උපකරණ සහ වායු සමීකරණ උපකරණ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින්මතු කලින් කලට සවිකරන ලබන හෝ ස්ථිරව ඇදුනු සියලු සහ වෙන් වෙන් වශයෙන් වූ නිශ්චල පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, උපකරණ සවිකිරීම් උපාංග හා සේවාවන් සහ සියලුම උපකරණ ද සමග වේ.

තවද, (ඉහත සඳහන් උපලේඛනයෙ හි සවිස්තරව දැක්වෙන) සබරගමුව පළාතේ, වරකාපොල, මාහේන මහනුවර පාරේ අංක 465 ස්ථානයේ කෑගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ පිහිටි ලිට්ල් හවුස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි තබා ඇති ගබඩාකර ඇති හෝ අනුබද්ධ හෝ ඇදා ඇති එක් එක් හෝ සියලුම පිරියත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සවිකිරීම් හා උපාංග ද සමග වේ.

ලිට්ල් හවුස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, මඩවල මද්දුමගේ දොන් සංජීව කනිෂ්ක ආරියවංශ සහ මානගොඩගමගේ අමාලි නිරෝෂනී වික්‍රමනායක යන අය උකස්කරුවන් වශයෙන් කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. තරංගා අයෝමි රත්නායක මහත්මිය විසින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්. සී. (බැංකුව) වෙනුවෙන් ලියා සහතික කරන ලද 2016.02.14 දින දරන උකස් බැදුම්කර අංක 9614 සහ උකස්බැදුම්කර අංක 9616 යටතේ වන ගෙවීම් පැහැර හැර ඇත.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. (බැංකුව) විසින් මා වෙත පවරා ඇති අවසරය පිට මා විසින් **2023 මාර්තු මස 17 වැනි සිකුරාද පෙ. ව. 10.00** ට එම ස්ථානයේ දී ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට යන මාර්ගය* .- එන්. ඩී. බී. බැංකුවේ වරකාපොල ශාඛා පරිශ්‍රයේ සිට කොළඹ මහනුවර පාරේ මහනුවර දෙසට කි. මී. 2.1ක් පමණ අඹේපුස්ස හන්දිය දක්වා ගොස් එතැනින් දකුණට හැරී නුවර පාරේ මීටර් 300ක් පසු කල විට එම පාරේ වම් පැත්තෙ හි ඇති මෙම ඉඩමට ළඟා විය හැකි ය.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - ජයග්‍රාහි ගැනුම්කරු විසින් ලංසුව පහත හෙලන විට පහත සඳහන් ගණන් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු වෙළඳ බදුවලින් 1%ක් (සියයට එක)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන ගැණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙක හමාර) සහ කොමිස් මුදලට අදාළ බදු මුදල්,
4. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තු වන රු. 1,000,
5. විකිණීමේ වියදම් සහ වෙනත් අයකිරීම් ඇතොත් ඒවා,
6. නොතාරිස්වරයාගේ සේවා කොන්දේසි ගාස්තුව වන රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් බලධාරියෙකු විසින් පනවනු ලබන හෝ අදාළ වන වෙනත් ව්‍යවස්ථාපිත බදු අයකිරීම්, තීරු බදු ගාස්තු ආදිය ද සමග විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු ය.

හිමිකම් සහතික සහ අදාළ වෙනත් ලේඛන පහත සඳහන් ලිපිනය දරන ස්ථානයේ දී පරීක්ෂා කළ හැකිය.

කළමණාකරු,
නැෂනල් ඩෙවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.
අංක 50, නවම් මාවත, කොළඹ 02.
දුරකතන අංක 011- 2448448.

ඉහත සඳහන් වෙන්දේසිය පූර්ව දැනුම් දීමකින් තොරව නැවැත්වීමට අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත. කෝවිඩ් 19 නීති රීති සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලැබූ මාර්ගෝපදේශවලට අනුව වෙන්දේසිය පවත්වනු ලැබේ.

Dallas Kelaart,
Licensed Auctioneer

No. 146/3, Caldera Gardens *off* Dutugamunu Street, Kohuwela
Tel: 11 4302622, 11 4302623 aucslk@gmail.com

03-103

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. ඒ. ඩී. කේ. ජයවර්ධන.
ගිණුම් අංක : 0074 5000 6917

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2021.03.25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි විසිඑක් ලක්ෂ දහ අට දහස් හත්සිය හැට අටයි ශත අනූ පහක (රු. 22,118,768.95) මුදල ද, 2021 ජනවාරි මස 07 වැනි දින සිට අංක 2521, 2699 සහ 2971 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි අනූනම ලක්ෂ හැට නමදහස් හාරසිය හැට හතයි ශත විස්සක (රු. 19,969,467.20) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.05.07 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2021.04.27 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි **2023.04.04 දින පෙ. ව. 11.30 ට පිහිටි** ස්ථානයෙ දී බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැදිරට කෝරළේ, බුත්තල මොණරාගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මොණරාගල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ මුප්පනේ අංක 129 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මුප්පනේ ග්‍රාමයේ පිහිටි ''කුමාර වත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. පෙරිම්පනාදන් යන අය විසින් සාදන ලද 2017 අප්‍රේල් මස 04 දාතම හා අංක 1655 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉ. ප්‍ර. කො. ඉඩම, නැගෙනහිරට : ඉ. ප්‍ර. කො. ඉඩම, දකුණට : ඉ. ප්‍ර. කො. ඉඩම, බස්නාහිරට : පාර සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි මුළු ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30.00) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග. එකී අංක 1655 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව A37/132 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1655 දරන එකී පිඹුරේ එකී ලොට් 1ට පිවිසුම වශයෙන් ලකුණු කොට ඇති මාර්ග වෙන් කිරීම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-98

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**මහනුවර දොඩම්වල ජෝර්ජ් ඊ. ද සිල්වා මාවතේ පිටකන්ද පිහිටි පර්චස් 10ක් විශාලැති අගනා දේපළක්**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවේ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටකන්ද ග්‍රාම නිලධාරි වසමේ, පිටකන්ද පිහිටි ''මෙට්ටපෙළ'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඉන්ද්‍රාණී මල්ලිකා විසින් සාදන ලද 2016 ජනවාරි මස 04 වැනි දිනැති අංක 2650 දරන පිඹුරේ ලොට් 6 ලකුණු කොට බෙදා වෙන් කර ඇති ඉඩම් කොටස.

ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. රාජරත්න විසින් ලියා සහතික කරන ලද 2019 සැප්තැම්බර් මස 23 දිනැති අංක 4007 දරන DFCC Bank PLC නමට ලියන ලද්දවූ ද, බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට ගාමිණී මුහන්දිරම්ලාගේ සහ වාසල මුදලි මුහන්දිරම්ලාගේ කසුන් කෞෂාලා මුහන්දිරම් ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ **2023 ක් වූ මාර්තු මස 29 වැනි දින පෙ. ව. 11.30 ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2022.12.09 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2022.11.15 වැනි දින ''දිවයින'' ''දි අයිලන්ඩ්'' සහ 2022.11.15 ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ට වන මාර්ගය.* -මහනුවර නගරයේ හෝරාස්ථම්භය අසළ සිට පැරණි පේරාදෙණිය පාරේ දෙඩම්වල මංසන්දිය දක්වා කි. මී. 1 පමණ ගමන් කර දකුණට හැරී ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ මීටර් 700 ක් පමණ ඉදිරියට ගොස් වමට හැරී අන්නිවත්ත උමග පාරට හැරී මීටර් 300ක් පමණ ඉදිරියට ගොස් වමට හැරී අන්නිවත්ත පාරේ මීටර් 400ක් පමණ ඉදිරියට ගොස් "Y" මංසන්දියෙන් දකුණට හැරී (කළුතර ස්ටෝර්ස් ආසන්නයේ) ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ මීටර් 900ක් පමණ ඉදිරියට ගොස් වමට හැරී බොරළු පාරේ මීටර් 110ක් පමණ දෙවැනි රාජසිංහ මාවතේ මීටර් 50ක් ඉදිරියට ගොස් වමට හැරී මීටර් 25ක් පමණ ඉදිරියට යාමේ දී පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බද්ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ, අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක : 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082,
ෆැක්ස් අංකය : 28711840.

03-11

---

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

මහනුවර හාරිස්පත්තුවේ තෙළඹුගහවත්ත ග්‍රාමයේ පිහිටි පර්චස් 32.2ක් විශාලැති අගනා ඉඩමක්

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ උඩුගම්පළ කෝරළේ තෙළඹුගහවත්ත ග්‍රාමයේ පිහිටි (1937 පෙබරවාරි මස 20 වැනි දින බලයලත් මිනින්දෝරු එෆ්. මාපලගම විසින් සාදන ලද අංක 544 දරන පිඹුරේ දක්වෙන ලොට් ඒ) බලයලත් මිනින්දෝරු එච්. එච්. එම්. ටී. ආර්. විජේරත්න විසින් 2005 අගෝස්තු මස 13 සහ 2005 අගෝස්තු මස 15 වැනි දිනයන්හි මැන සාදන ලද අංක 2098 දරන පිඹුරේ සඳහන් ලොට් 2 දරන ''බොකුටුවේවත්ත'' නොහොත් ''බෝගහකොටුවේවත්ත'' නමැති ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්ලිව්. එන්. කේ. හීන්කෙන්ද විසින් 2011 සැප්තැම්බර් මස 19 වැනි දින අංක 1543 දරන DFCC Bank PLC (DFCC වර්ධන බැංකුවේ අනුප්‍රාප්තික) නමට ලියන ලද්දවූ ද,

බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට හතර කෝරළේ නුහු ලෙබ්බේ සෙයියදු මොහමඩ් සලීම් මොහමඩ් නොහොත් හතරකෝරළේ නුහු ලෙබ්බේ සෙයියදු මොහමඩ් සලීම් මොහොමඩ් සහ මොහමඩ් රසීත් ෆාතිමා ෆයිරූෂියා ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය මත ඉහත සඳහන් දේපළ **2023 ක්වූ මාර්තු මස 24 වැනි දින ප. ව. 2.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා* : 2022.11.25 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2022.11.04 වැනි දින ''දිවයින'' ''දි අයිලන්ඩ්'' සහ 2022.11.08 දින ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ඨ වන මාර්ගය.* -මහනුවර නගරයේ සිට මාතලේ පාර ඔස්සේ කි. මී. 9 ක් පමණ අකුරණ 7 සැතපුම් කණුව දක්වා (මුස්ලිම් පල්ලිය මංසන්ධිය) ගමන් කර දකුණට හැරී තෙළඹුගහවත්ත පාරේ කි. මී. 1.25 පමණ තෙළඹුගහවත්ත මුස්ලිම් පල්ලිය දක්වා ගමන් කර වමට හැරී රතුකොහෝ දීගල පාරේ මීටර් 75ක් පමණ ගමන් කිරීමෙන් පසු පාරේ වම් පසින් පිහිටි මෙම දේපළට ළඟාවිය හැකිය.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අය විය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ, අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ කළමණාකරු, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.
දුරකථන අංක : 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082,
ෆැක්ස් අංකය : 2871184.

03-12

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**ඇඹිලිපිටිය මෝදරවාන පාරේ උඩුගම ග්‍රාමයේ පිහිටි අක්කර 01යි පර්චස් 21.24 ක් විශාලැති අගනා දේපළක්**

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ දියපොතගම් පත්තුවේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ උඩුගම ග්‍රාම නිලධාරි වසමේ ඇඹිලිපිටිය උඩුගම ග්‍රාමයේ පිහිටි "මෝදරවානහේන්යාය" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එස්. මුණසිංහ විසින් සාදන ලද 2011 සැප්තැම්බර් මස 30 වන දිනැති අංක. 2011/103 දරන පිඹුරේ ලොට් A ලකුණු කොට බෙදා වෙන්කර ඇති ඉඩම් කොටස.

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. බී. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද 2018 මාර්තු මස 21 දිනැති අංක. 7470 සහ 7472 DFCC Bank PLC නමට ලියන ලද්දවූ ද, බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට පුෂ්පකුමාර ආරියසිංහ ණයකරු/ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ **2023 ක්වූ අප්‍රේල් මස 06 වැනි දින ප. ව. 3.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා* : 2022.11.25 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2022.04.11 වැනි දින ''දිවයින'' ''දි අයිලන්ඩ්'' පුවත්පත් සහ 2022.04.08 ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ඨ වන මාර්ගය.* -ඇඹිලිපිටිය නගරයේ සිට ඇඹිලිපිටිය නව නගරය පාර ඔස්සේ කි. මී. 1 ක් පමණ ගමන් කර දකුණට හැරී මෝදරවාන පාරේ මීටර් 500 ක් පමණ ගමන් කිරීමෙන් පසු පාරේ දකුණු පසින් පිහිටි මෙම දේපළට ළඟාවිය හැකිය.

